# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,937/2 — 1970 දෙසැම්බර් 20 වැනි ඉරිදා — 1970.12.20**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය—අංක 61/9/473

ආදායම් සංරක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1970 දෙසැම්බර් මස 21 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තු වලට අතිරේක වශයෙනි.

රබර්

| | | රු. | ශ. |
|---|---|---|---|
| නොම්මර එකේ ආර්.එස්.එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එප්.ඕ.බී. වටිනාකම රාත්තලකට | ... | 1 | 01 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලකට ... ... ... | ... | 0 | 05 |

කේ. පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක : ඒ. 781,
1970 දෙසැම්බර් 20 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

---

### රේගු දැන්වීම—අංක 67/3/161

1967 නොවැම්බර මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1970 දෙසැම්බර් මස 21 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,378.22 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1000 ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 457 86 | 557 14 | 473 14 | 114 46 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

කේ. පී. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක : ඒ. 744/22,
1970 දෙසැම්බර් 20 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

952/3——ජේ 19892—11,195 (70/12)